**පරිසර විද්‍යාව**

# මහවැලි ගඟේ උපත කොතැනද?

**එස්.කේ. ජයවර්ධන**

ලංකාවේ දිගම ගඟ සැතපුම් 208 දිග මහවැලි ගඟ යි. මහවැලියේ ආරම්භය ගැන කෙටි ශාස්ත්‍රීය සටහනක් මෙහි එයි. අද මහවැලි ගඟ ඇදෙනුයේ හැටන් ගඟ හා කොත්මලා ඔය යන ජලධාර දෙක නාවලපිටිය නුදුරු පස්බාගේ පොල්වතුරේ දී එකතුවීමෙනි. මහනුවර යුගයේ ලියවුණු 'මහවැලි ගංවරුණේ' නම් කවි පොත අනුව මහවැලි ගඟේ පරිවාර ගංගා 17000ක් ඇත.

අද මහවැලිය ලෙස හඳුන්වන ගංගාව එදා වෙන වෙන ම ගලා ගිය ගංගා තුනක් භූ විපර්යාස නිසා එකට එකතු වී පිලිලයක් ලෙස එකට වැඩී බැඳී ඇති බව මහාචාර්ය කුලරත්නම් කිය යි. විශේෂයෙන් කුඩා ජලමාර්ගයක විශාල වතුර කඳක් ගලනුයේ ගංගා තුනක් එකිනෙක ඩැහැ ගැන්ම නිස යි.

අද කැලණි ගඟේ මුල් ශාඛාවන් වූ මස්කෙලිය ඔය හා බගවන්තලාව කඳු හරහා ගලන කෙහෙල්ගමු ඔය ගිනිගත්හේන නුදුරු කළුගල දී එකට එකතු වී කැලණි ගඟ සාද යි. අතීතයේ මස්කෙලිය ඔය මහවැලි ගඟේ මුල් දිය දහරක් වූ අතර පසු කල මහවැලි ගඟින් මස්කෙලිය ඔය, කැලණි ගඟ විසින් ඩැහැගන ඇත.

මහවැලි ගඟ ශ්‍රී පාද කඳුවැටියෙන් ඇරඹෙන බවට පාරම්පරික විශ්වාසයක් ඇත. ඒ විශ්වාසයේ හරයක් නැත. මා දිගු කලක් හැටන් ශ්‍රී පාද මහා විද්‍යාලයේ හා මස්කෙලිය සමන්මලි මහා විද්‍යාලයේ විදුහල්පතිව සිටියදී කළ නිරීක්ෂණ අනුව ශ්‍රී පාද කඳු වැටියට සම්බන්ධ කිසි ම දිය දහරක් ඍජු ලෙස මහවැලි ගඟට එකතු නොවෙයි.

## හැටන් ගඟ

හැටන් ගඟ නම් ඉතා කුඩා සීතල දිය පාර අඩි 6000 උස එල්බැද්ද කඳු වැටියෙන් ඇරඹෙයි. එල්බැද්ද කන්ද ශ්‍රී පාද කඳු වැටියට සම්බන්ධයක් නැත. හැටන් ගඟේ ආරම්භය හරියට ම කිවහොත් හැටන් නගරයට ජලය සපයන සිංගිමලේ ජලාශයේ උතුරා යන ජලයෙන් ඇති වෙයි. මේ කුඩා සීතල දෙලපාර ඩන්බාර්වත්ත හරහා හැටන් නගරයේ ජලධාරා එකතු කරගෙන හැටන් දුම්රියපල අසලින් ගලා අවුත් හැටන් ටවුම කෙලවර පෘට්හිල් ප්‍රදේශයේ ප්‍රින්සස් සිනමාහල අසලින් පහළට ගලයි.

අඩියක් තරම පළල සීතල පිරිසිදු හැටන් දිය දහර ඉදිරියට ගලන විට ඒ දෙපස ඇති තේ වතුයාය හයකින් ගලන ජලධාරා එකතු වෙයි.

ඒ තේ වතු යාය හය නම්;

1 ස්ට්‍රෙත්ඩන් වතුයායේ පෙන්ටූර් දිය දහර
2 ෂැනන් දිය දහර
3 ස්ට්‍රෙත්ඩන් වතුයායේ කොල්ඩ් ස්ට්‍රීම්
4 වටවල කඩමණ්ඩියේ දී එකතුවන කොල්ඩ් ස්ට්‍රීම් අංක දෙක දිය දහර
5 මනික්වත්ත දිය පාර
6 කුයිල්වත්ත

3) හැටන් ගඟට බටහිර දිශාවෙන් වතුවලින් එකතුවන දිය දහරා පහකි.


1.කුඩු ඔය හෙවත් කුඩා ඔය
2.ස්ට්‍රෙත්ඩන් වතුයායේ බංගලාව අසලින් ගලන දිය පාර
3. බිං ඔය
4. වටවල
5. රොසල්ලේ ටෙම්පස්ටෝ දිය දහර

4) හැටන් - රොසැල්ල - වටවල - දීගල - අඹගමුව - ගිනිගත්හේන හරහා හැටන් ගඟ ගලන විට පතුල පෙනෙන තරම් පිරිසුදු ය. ගඟ අඩි 5 කට වඩා පළල නැත.

5) ගිනිගත්හේන කඳුවැටිය මැදින් හැටන් ගඟ ගලන විට එක ම කඳු වැටියේ බෑවුම දෙපැත්තෙන් එක් පැත්තක හැටන් ගඟ ද අනිත් බෑවුමේ කැලණි ගඟට මුල් වන මස්කෙලි ඔය ද සමාන්තරව ගලයි. ගිනිගත්හේන, දූනට වසා දමා ඇති කුඩ කම්හල අසල දී හැටන්ගඟ හා මස්කෙලිය ඔයේ පරතරය ඉතා ම කිට්ටු යි. මේ අවට බහුලව නාය යයි. ගිනිගත්හේන මහා විද්‍යාලයට පහළින් හැටන් ගඟින් දියතිල්ල නම් විශාල උල්පතක් මතුවෙයි. ගිනිගත්හේන නුදුරු අලගලගිනියගල ගමේ ඇති දියතිල්ල උල්පත මතු වූයේ 1947 ගංවතුරට පසුවයි. ඒ කිසිද නොසිඳෙන වතුර ගොබයකි. දියතිල්ල උල්පතින් හැටන් ගඟේ වතුර මතුවෙයි. අනාගතයේ දියතිල්ල අසලින් හැටන් ගඟ කැලණි ගඟ විසින් ඩැහැ ගැනීමේ ඉඩකඩ වැඩි ය.

6) හැටන් ගඟට අඹගමුවේදී කහවතු ගඟ එකතු වෙයි. කහවතු ඔය හා කන්දල් ඔය ආරම්භ වනුයේ

**මහවැලි ගඟ ශ්‍රී පාද කඳුවැටියෙන් ඇරඹෙන බවට පාරම්පරික විශ්වාසයක් ඇත. ඒ විශ්වාසයේ හරයක් නැත. මා දිගු කලක් හැටන් ශ්‍රී පාද මහා විද්‍යාලයේ හා මස්කෙලිය සමන්මලි මහා විද්‍යාලයේ විදුහල්පතිව සිටියදී කළ නිරීක්ෂණ අනුව ශ්‍රී පාද කඳුවැටියට සම්බන්ධ කිසි ම දිය දහරක් ඍජු ලෙස මහවැලි ගඟට එකතු නොවෙයි.**



හොරගොල්ල කැලේ තේ වතු යායෙනි. හොරගොල්ල කැලේ සිට අඹගමුව දක්වා සැතපුම් 6 ක් දුර ගලා අවුත් කහවතු ගඟ අඹගමුව වෙල්යාය අසලදී හැටන් ගඟට වැටෙයි.

7) උස්සිලියා කඳු රිලාගල කඳු අතරින් ඇරඹී වල්ගම්පල දක්වා ප්‍රදේශයෙන් ගලන ගංගා ඔයවල් හතරක් ඉන්පසු හැටන් ගඟට වැටෙයි. ඒවා නම් ගලබඩ ඔය, ප්‍රෙම්රෝස් ගඟ, රත් ඔය, කැන්දෝ ගඟ.

8) මින් ගලබඩ ඔය, කැන්දෝ ගඟේ මුල් අත්තකි. ඉහළ සිට ගලා අවුත් ගලබඩ දුම්රිය පළ අසල දී හැටන් ගඟට වැටෙයි. ප්‍රෙම්රොස් ගඟ ප්‍රෙම්රෝස් වතුයායේ සිට ඇරඹී ගලයි.

9) ඉඟුරු ඔය දහන කන්දේ සිට ගලයි. නාවලපිටියට සැතපුම් හතරක් ඈත වටවල නුදුරු හයිබ්‍රි වතුයායේ අඩි 4000 උස දහන කන්දෙන් ඉඟුරු ඔය ඇරඹෙයි. ඉඟුරු ඔය තවත් නම් දෙකකින් හැඳින්වෙයි. හල්ගාරන් ඔය හා හඟුරන් ඔය යනුවෙනි. ඉඟුරු ඔයේ ස්වභාවික ජලධාරාවලින් ගලන අඩි 2 තරම ගැඹුරු අක්කර 4ක් තරම විශාල ස්වාභාවික විල් තුනක් තරම දහන කන්දේ ඇත. හැවැත් පත් වැවුණු ඉතා විසිතුරු මේ විල්වල ජලය උතුරා පහළ විලට සිත් ගන්නා ලෙස ගලන අයුරු සිත් වශී කරවයි. ඉඟුරු ඔය හැටන් ගඟට වැටෙයි.

10) රිලාගල කන්දේ බටහිර බෑවුමෙන් කැන්දෝ අතු ගඟ ඇරඹී ගලයි. රිලාගල නැගෙනහිර දිය දහරාවලින් කොරවක්කා ඔය ඇරඹෙයි. කැන්දෝ ගඟ හා කොරවක්කා ඔය ජලය හැටන් ගඟට වැටෙයි. කැන්දෝ ගඟ උස්වැලි කන්ද හා දහන කන්දේ ජලධාරවලින් පෝෂණය වී වැලිගම්පල හරහා සැතපුම් 12 දුරට ගලා ගලබඩ විසිතුරු දිය ඇලි මවා ඉන්පසු හැටන් ගඟට එකතු වෙයි.

11)) බ්ලැක් වෝටර් වතුයායෙන් ඇරඹෙන දෙකිඳ ඔය දෙකිඳ හරහා ගලා ලෙව්දෙනිය දී හැටන් ගඟට වැටෙයි.

12) රිලාගල කන්දේ බටහිර බෑවුමේ දෙකිඳ වැවෙන් ඇරඹී බටහිරට ගලන ලේල්කඳුර ඔය වැලිගම්පල නවංගම හරහා හැටන් ගඟට වැටෙයි.

13) දෙකිඳ නුදුරු ලෙව්දෙනිය අසල දී ආගර ඔය ඉලුක්තැන්න අලුත්ගම හෙවත් බලංතොට හරහා හැටන් ගඟට වැටෙයි. බලංතොට අවට මැණික් ගැරීමෙන් විනාශව ඇත. මේ ප්‍රදේශය මැණික්වලට ප්‍රසිද්ධ යි.

14) කබරගල කන්දේ බටහිරින් ඇරඹෙන කොරකඩ ඔය මුළු දිග සැතපුම් 7 ක් ගලා රඹුක්පිටිය මහා විද්‍යාලය අසලින් හැටන් ගඟට එකතු වෙයි.

කොත්මලේ ඔය යනු ප්‍රධාන ඔයවල් පහක ජලධාරා එකතුවකි. ඒ ඔයවල් නම් අග්‍රා, දඹගස්තලාව, නානු ඔය, පුන්ඩලු ඔය හා පූනා ඔය යි.

15) කබරගල කන්දේ සිට ගලන හල් ඔය රඹුක්පිටිය දෙල්ගහ ඇල්ලෙන් සැතපුම් 4ක් මුළු දුර ගෙවා හැටන් ගඟට වැටෙයි.

6) ගෘෘක් ඔය හෙවත් කොරවක්කා ඔය අඩි 4700 උස ක්වීන්ස් බෙරි කැලෑවෙන් උපදියි. ක්වීන්ස්බෙරි දොලපතන වුඩ්ස්ටොන් රිලාගල මැසිමලේ හරහා ගලන විට කොරවක්කා ඔයෙන් කඩියන්ලෙන නුදුරු විසිතුරු කඩියන්ලෙන දිය ඇල්ල සෑදෙයි. ගෘෘක් ඔය යන ඉංග්‍රිසි නම සිංහල කටට හුරු වී ගොරක ඔය කොරවක්කා ඔය ලෙස සිංහලට කැඩී ඇත. නාවලපිටිය මල්ලන්ද මැදගහවතුර පසු කර හැටන් ගඟට වැටෙයි. ඒ අතරතුර දියධාරාවල ජලය කොරවක්කා ඔයට එකතුවෙයි. ඒ අතර තිස්පනේ වත්තෙන් ගලා එන දියදහර හා බව්වාගම ග්‍රීන්වුඩ් අසල දී කොරවක්කා ඔයට එකතුවන ගල්ඔය උදහරණ යි.

17) හැටන් සිට ගිනිගත්හේනට දුර සැතපුම් 15 කි. කොත්මලේ ඔය හැටන් ගඟට වැටෙන පොල්වතුර ගමට එනවිට හැටන් ගඟ ඉහත දැක්වූ ගංගා ඔයවල් රැස ද එකතු කර ගෙන හැටන් සිට සැතපුම් 30 ක් දුර ගෙවයි.

## කොත්මලේ ඔය ආරම්භය

හැටන් කටුගස්තොට අතර දී හැටන් ගඟට වැටෙන ප්‍රධාන ම ගංගාව සැතපුම් 43 ක් දිග කොත්මලා ඔය යි. කොත්මලා ඔයේ ජලපෝෂණ ප්‍රදේශය වර්ග සැතපුම් 226 වෙයි. වාර්ෂිකව අඟල් 80 - 150 දැඩි වර්ෂාපතනයක් ලැබෙන උස් කඳුකරයෙන් උපත ලබන කොත්මලේ ඔයට ඒ ප්‍රදේශයේ සියලු ජලධාරා වැටෙයි. කොත්මලේ ප්‍රදේශයේ කොත්මලා ඔයට නොගලන එක ම ජල දහර කොරවක්කා ඔය යි . ඒ හැටන් ගඟට ගලයි. කොත්මලේ ඔයට ගලන ප්‍රධාන ජල දහරා නම් නානු ඔය, ගංතුරා ඔය, දෙව්තුරු ඔය, පූනා ඔය, පුණ්ඩලු ඔය, නිදහන් කොටුව ඔය, හීමල් ඔය හා නියන්ගන්දර ඔය යි . දැන් ඒ කෙටියෙන් බලමු.

කොත්මලා ඔයේ ගැලීම කඳුරට භූ විෂමතාවට එකඟ නැත. ලිඳුල සිට බෝගහවත්ත දක්වා කඳු වැටිවලට අනුකූලව ගලයි. නානු ඔය සිට ඕතලාව දක්වා කඳුවැටිවලට විරුද්ධව ගලයි. අතීතයේ කොත්මලා ඔය වයඹට ගලා ගොස් මහ ඔයට එකතු වූ බව මහාචාර්ය කුලරත්නම් කිය යි. එද මහ ඔයේ විශාල ජලකඳක් ගැලූ නමුදු අද ජලකඳ අඩු ය. වැලි සහිත නිම්නය එහි අද ඒ නිසා පුළුල් ව ඇත. මුලදී මහ ඔයට වැටුණු කොත්මලා ඔය භූ විෂමතා නිසා පසු කල මහවැලි ගඟට එකතු වී ඇත.

1) කොත්මලේ ඔය යනු ප්‍රධාන ඔයවල් පහක ජලධාරා එකතුවකි. ඒ ඔයවල් නම් අග්‍රා, දඹගස්තලාව, නානු ඔය, පුණ්ඩලු ඔය හා පූනා ඔය යි. මේ ඔයවල් පහේ ජලය එකතු වී ගලා එන විට තලවාකැලේ නුදුරුව දී ඩෙවන් හා සාන්ත ක්ලෙයාර් දිය ඇලි දෙක වැටෙයි. කොත්මලා ඔය කඩදෙරදී හරස් කර කොත්මලේ ජලාශය බැඳ ඇත.

2) කොත්මලේ ඔය ඇරඹෙන මුල් ම දිය දහර හැටන් සානුවේ අඩි 6500 -7000 ඉහළ අග්‍රා ඔය යි. ඒ මධ්‍ය කඳුකර උස් ම බිමකින් ඇරඹෙයි. අග්‍රා ඔය ආගරපතන ග්ලෙන්ලොච් පසුකර බටහිරට බරව වයඹට ගලද්දී අග්‍රා ඔය කැලිඩෝනාහි දී දඹගස්තලාව ඔය එකතු වෙයි.

3) දඹගස්තලාව ඔය අඩි 5000 උස අඹේවෙල කඳුවලින් ඇරඹෙයි. එය අග්‍රා ඔයට සමාන්තරව ගලා අවුත් කැලිඩෝනියා හි දි අග්‍රා ඔයට එකතු වෙයි. කැලිඩෝනියා හි දී අග්‍රා ඔය හා දඹගස්තලාව ඔය එකතු වී ටිල්කෝල්ට්‍රි හා ලිඳුල ඔස්සේ තලවකැලේට ගලයි.

4) නුවරඑළියේ අඩි 7000 උස කඳුවලින් ඇරඹී නානු ඔය ගලයි. පුණ්ඩලූ ඔය යටිනැම්ම දිගේ අඩි 2000 පමණ උස බිත්ති සහිත ගංදොරු ඇති කරමින් නානු ඔය ගලා අවුත් තලවාකැලේ අසල දී අග්‍රා හා දඹගස්තලාව ඔයවල් දෙකේ ජලකඳ වැටෙයි. අග්‍රා ඔය දඹගස්තලාව හා නානු ඔය තලවාකැලේ දී එක්වූ විට මේ ජලකඳ කොත්මලේ ඔය නමින් ප්‍රකට වෙයි. දැන් කොත්මලේ ඔය ඊසාන දිගට බරව ඕතලාව දෙසට ගලයි.

5) නුවරඑළියේ අඩි 7000 උස ග්‍රේට් වෙස්ටර්න් කඳුවලින් ඇරඹී ගලන පූණ්ඩලූ ඔය ගලාගෙන අවුත් මල්දෙනිය අසලදී කොත්මලා ඔයට වැටෙයි. පුණ්ඩලූ ඔය උපත ලබනුයේ ග්‍රේට් වෙස්ටර්න් කඳුවලිනි.

6) පිදුරුතලාගල කඳුවලින් උපත ලබන පූනාඔය කොත්මලා ඔයට එකතු වනුයේ හැඳුන්වැව නුදුරු ඕතලාව දී ය.

7) මෙසේ අග්‍රා, අඹගස්තලාව, නානු ඔය, පුණ්ඩලූඔය, පූනා ඔය යන ප්‍රධාන ඔයවල් පහ එකතු වී කොත්මලේ ඔය ලෙස ගලා යන විට අවට දිය ඇලි ඇලවල් කඳුරු රැසක තවත් ජලය එකතු වෙයි. කොත්මලේ ඔය සැතපුම් 40 දුර ගලයි.

8) හැටන් සිට සැතපුම් 30 ගංගා ඔයවල් රැසක ජලය රැගෙන එන හැටන් ගඟට අග්‍රා ඔය සිට සැතපුම් 43 දුර ගලා එන ප්‍රධාන ඔයවල් පහක ජලය රැගත් කොත්මලේ ඔය නාවලපිටිය පස්බාගෙ පොල්වතුර ගමේ දී හමු වෙයි. හැටන් ගඟ හා කොත්මලා ඔය පොල්වතුරේ දී එකතු වී මහවැලි නමින් ගම්පල දෙසට ගැලීම ඇරඹෙයි.

❑